07
පාඩම

# ඉල්ලන්නා පිරිහෙන්නේ ය.

## බ්‍රහ්මදත්ත ජාතකය

භික්ෂූන් වහන්සේලා යැපෙනුයේ ගිහි සැදැහැවතුන් පූජා කරන සිව්පසයෙනි. එම කරුණ ''පරපටිබද්ධා මෙ ජීවිකා.....'' යනාදී වශයෙන් නිතර සිහිපත් කළ යුතු බව දසධම්ම සූත්‍රයෙහි ඉගැන්වේ. නමුත් ඉල්ලීම නම් නුසුදුසු ය. අනුන්ගෙන් යම් යම් දේවල් ඉල්ලීම ආත්ම ගෞරවයට බරපතල හානියකි. අධිකව යාචනයෙන් ඉල්ලන්නා අප්‍රිය වේ, තරහ සිත් ඇති වේ. එය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිසත්, පැහැදුනවුන්ගේ වැඩි පැහැදීම පිණිසත් හේතු නොවන්නේ ය. බඹරා මලටත්, මලේ රොන්වලටත්, සුවඳට මෙන් ම පැහැයටත් හානි නොවන සේ රොන් ගන්නාක් මෙන් භික්ෂූන් වහන්සේ ද ගිහි සැදැහැවතුන්ට හිරිහැර නොවන පරිදි යැපිය යුතු බව ධම්මපදයේ පුප්ඵ වග්ගයෙහි ''**යථාපි භමරො පුප්ඵං.....**'' යනාදී ගාථාවෙන් ඉගැන්වෙයි. මේ සම්බන්ධව ම මනාව ඉගැන්වෙන ජාතක කතාවක් ලෙස බ්‍රහ්මදත්ත ජාතකය හැඳින්විය හැකි ය.

## වර්තමාන කතාව

බුදු රජාණන් වහන්සේ අලව් නුවර අග්ගාළව නම් චෛත්‍යය පිහිටි ස්ථානයෙහි වාසය කරන සමයෙහි භික්ෂූන් වහන්සේලා ආවාස තැනීම සඳහා යම් යම් උපකරණ ආදිය ඉල්ලා මහජනයා වෙහෙසට පත් කිරීමේ සිද්ධියක් අරභයා මෙම ජාතකය වදාළ සේක.

අලව් නුවරවාසී බොහෝ භික්ෂූන් වහන්සේලා ආවාස සාදා ගැනීමට කැති, පොරෝ ආදී ආයුධ දෙන්නැ යි, කියා නිතර මිනිසුන්ට කරදර කරති. එබැවින් මිනිස්සු භික්ෂූන් දැකීමට පවා මැලි වෙති. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ එ නුවර පිඬු සිඟා වැඩි අවස්ථාවක පෙර උන් වහන්සේ වඩින පෙර මග බලා සිට දන් පිළිගැන් වූ සැදැහැවත්හු පවා සැඟවෙන්නට වූ හ. මේ බව උන් වහන්සේ බුදු රදුන්ට සැලකර සිටිය හ. බුදුරජාණන් වහන්සේ අලව් නුවර සියලු භික්ෂූන් කැඳවා මේ පිළිබඳ විමසූ හ. උන් වහන්සේලා එය සැබෑවැ'' යි, පිළිගත් හ. එවිට බුදුරජාණන් වහන්සේ,

''මහණෙනි, භික්ෂූන් නම් දැහැමෙන් සෙමෙන් ලත් දෙයක් විනා සැදැහැවතුන්ගෙන් කිසිවක් ඉල්ලා නොසිටිය යුතු ය. එසේ ඉල්ලූ කල සැදැහැවතුනට පැවිද්දන් කෙරෙහි කළ කිරීම් ඇති වෙයි. ඉල්ලීම කිසිවකුටත් මිහිරි දෙයක් නොවේ. බොහෝ සම්පත් ඇත්තෝ පවා ඉල්ලීම නිසා කණස්සලු වෙති. පෙර උතුමෝ එක් කඩයක් හා පාවහන් යුවලක් පවා ඉල්වා ගත නොහැකිව දොළොස් අවුරුද්දක් ම ලජ්ජාවෙන් කල් ගෙවූ හ'' යි, අතීත පුවත වදාළ සේක.

## අතීත කතාව

යටගිය දවස දඹදිව උත්තර පංචාල රට කම්පිල්ල නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් රාජ්‍යය කරන සමයෙහි අප මහ බෝසතාණන් වහන්සේ එක්තරා බ්‍රාහ්මණ කුලයක උපන් හ. රූපාදී පංච කාමයෙහි ආදීනව දැක සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූ බෝසතාණෝ හිමාල වනයෙහි වැඩ විසූ හ. ලුණු ඇඹුල් සේවනය සඳහා කම්පිල්ල නුවරට පැමිණි බෝසත් තාපසතුමා රජුගේ මඟුල් උයනෙහි නවාතැන්ගෙන සිටියේ ය. ඒ බව ඇසූ බ්‍රහ්මදත්ත රජු තාපසතුමා බැහැදැක පැහැදී ඉදිරි වස් සාරමස උයනෙහි වාසය කරන ලෙස ආරාධනා කළේ ය.

තාපසතුමා වස් අවසානයේ දී පෙරළා හිමාල වනයට යනු කැමතිව ගමනට අවශ්‍ය පාවහන් යුගලක් හා පත් කඩයක් රජුගෙන් ඉල්ලා ගැනීමට සිතුවේ ය. එහෙත් ඒ කෙරෙහි ලජ්ජාවෙන් මෙසේ ද සිතී ය.

''යම් කෙනෙකුගෙන් මට මේ දෙය නැතැයි, කියා යමක් ඉල්ලීම යනු එක් හැඬීමකි. දෙන තැනැත්තා එම ඉල්ලීමට ''නැතැයි'' යි, කීවේ නම් එය දෙවැනි හැඬීමය. මේ අප දෙදෙනාගේ අඬන හැඬීම බොහෝ දෙනා මැද කිරීම සුදුසු නොවේ. කිසිවෙකු නැති තැනක දී රහසිගතව ඉල්ලා ගන්නෙමි ''

එසේ සිතූ තාපසතුමා රජතුමා අමතා ''රජතුමනි, රහස් කටයුත්තක් ඇත. තනිව කීමට කැමැත්ත ඇත්තේ වෙමි'' යි, කීය. ඒ ඇසූ රජතුමා ළඟ සිටින්නන් ඉවත් කරවීය. ඉක්බිති තාපසතුමා යම් හෙයකින් මා යමක් ඉල්ලූ කල රජතුමාට දෙනු නොහැකිව නැතැයි, කිවහොත් එයින් රජතුමා තුළ කණස්සල්ලක් ද ඇති වන්නේ ය. අප කෙරෙහි මෛත්‍රිය ද හීන වන්නේ ය.

එනිසා කිසිවක් නො ඉල්වමි'' යි, තීරණය කොට ''මහරජතුමනි, මම එය පසුව කියන්නෙමි' යි, කියා රජු පිටත්කොට හැරියේ ය. නැවත අන් දිනක රජු පැමිණි විට ද එය කියන්නට සිතුවත් තාපසතුමාට ලජ්ජාව නිසා කියාගත නොහැකි විය. මෙසේ මෙම ඉල්ලීම කරගත නොහැකිව දොළොස් අවුරුද්දක් ම ගත විය.

දොළොස් අවුරුද්දක් ම ඉක්ම ගිය කල රජු මෙසේ සිතීය. ''තාපසතුමා මාගෙන් යමක් ඉල්ලීමට සිතන්නේ දොළොස් අවුරුද්දක සිට ය. අද මම උයනට ගොසින් ඒ ගැන විමසමි. තාපසතුමාට ගිහිගෙය ගැන ඇල්ම ඇතිව මා වෙතින් රාජ්‍යය ඉල්ලා සිටින අභිප්‍රායෙන් සිටිනු විය හැකි ය. රජදරුවන්ගෙන් රාජ්‍යය ඉල්ලා සිටීම නම් සුදුසු නොවෙයි. රජදරුවෝ නම් රාජ්‍ය ලෝභය ඇත්තෝ යැයි, කියා මගෙන් රාජ්‍යය නොඉල්ලා සිටිනවා විය හැකි ය. එහෙත් අද මම රාජ්‍යය ඉල්ලුවත් දෙමි. රාජ්‍යයෙන් අඩක් ඉල්ලුවත් දෙමි''

අනතුරුව රජු උයනට පිවිස තාපසතුමාට වැඳ ''ස්වාමීනි, ඔබ වහන්සේ මා වෙතින් යම් දෙයක් ඉල්ලීමට අදහස් කොට ලතවෙන්නේ දොළොස් අවුරුද්දක සිට ය. අද නුඹ වහන්සේ මාගේ රාජ්‍යය ද ඇතුලුව කැමති ඕනෑම දෙයක් ඉල්ලුව මැනවි. එය දෙමි'' යි, කීය.

එවිට තාපසයාණෝ ''රජතුමනි, මා ඉල්ලූ දෙයක් දෙන්නේ වේ දැයි'' ඇසූ හ. එයට පිළිතුරු දුන් රජු '' රාජ්‍යය දෙමි යි, කියන්නා වූ මට වෙනත් කිනම් වස්තුවක් නොදෙන්නෙමි යි, කිව හැකි ද? එවිට තාපසයාණෝ ''මහ රජතුමනි, මම හිමාලයට යාමට කැමැත්ත ඇතිව සිටිමි. පාවහන් සඟලක් හා පත් කඩයක් ලබාගනු කැමැත්තෙමි'' යි, කීය.

ඒ ඇසූ රජු මෙපමණ සුලු දෙයක් මට මෙතෙක් කල් නොකීවේ මන්දැයි, විමසීය. එයට පිළිතුරු දුන් තාපසතුමා, ''පංචාලයාධිපතිතුමනි, ඉල්ලන්නෙකුට ලාභය හෝ අලාභය යන දෙකෙන් එකකට පත්වීමට සිදු වේ. ඉල්ලීම යනු එබඳු දෙයකි. ඉල්ලීම හැඬීමකැයි, කියයි. එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම පෙරළා හැඬීමකි. පංචාල වැසියෝ මාගේ හැඬීමත්, ඔබගේ පෙරළා හැඬීමත්, නො දකිත්වා යි යන හැඟීමෙන් මම එය රහසිගතව කීමට තීරණය කළෙමි'' යි, පැවසී ය. එබස් ඇසූ රජතුමා තාපසතුමා කෙරෙහි වඩාත් පැහැදුනේ ය. පැහැදී රාජ්‍යයම දෙන්නට සැරසුණේ ය. එවිට තාපසතුමා ''මහරජ මම පංචකාමයෙහි ආදීනව දැක සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූ කෙනෙක් වෙමි. එහෙයින් මට මෙම වස්තුවෙන් කිසි ප්‍රයෝජනයක් නැත. මට මේ පත් කඩයත්, පාවහන් සඟලත් පමණක් ඇතැයි කියා ඒ දෙක පමණක් ගෙන මහ රජතුමනි, අප්‍රමාදීව කටයුතු කරනු මැනවි. දන්දෙනු මැනවි, සිල් රකිනු මැනවි, පෙහෙවස් සමාදන් වනු මැනවැ'' යි, රජුට ඔවදන් දී තව දුරටත් උයනෙහි වැඩ සිටින ලෙස රජු පෙරැත්ත කරද්දී හිමාලය බලා වැඩම කළේ ය. එහි දී පංච අභිඥා, අෂ්ට සමාපත්ති උපදවා මිය පරලොව ගොස් බඹලොව උපන්නේ යැයි මේ ජාතක කතාව ගෙන හැර දක්වා වදාළ සේක. එදා බ්‍රහ්මදත්ත රජු නම් ආනන්ද තෙරණුවෝ ය. තාපසතුමා වූ කලී බුදු වූ මම් ම වේ යැයි, තමන් වහන්සේ දක්වා වදාළ සේක.

**අභ්‍යාස**

01. ''යමෙකුගෙන් යමක් ඉල්ලීම එක් හැඬීමකි. දෙන තැනැත්තා එම ඉල්ලීමට නැතැ යි, කීවේ නම් එය දෙවන හැඬීම ය'' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.
02. බ්‍රහ්මදත්ත ජාතකය මූලාශ්‍ර කරගෙන ''යාචනය ආත්ම ගෞරවයට හානියකි '' මැයෙන් බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.

### භාවිතයට

යථාපි භමරො පුප්ඵං - වණ්ණ ගන්ධං අහෙඨයං
ඵලෙති රසමාදාය - එවං ගාමෙ මුනී චරෙ

(ධම්මපදය - පුප්ඵ වග්ගය)

බඹරා මල පැහැය හා සුවඳ නොපෙළමින් පැණිගෙන යන්නාක් මෙන් මහණහු ගම හැසිරෙති.

දෙහීති වචනං කෂ්ටං
නාස්තීති වචනං තථා
දෙහී නාස්තීති වා වාක්‍යං
මාභූද් ජනමනි ජනමනි

(ව්‍යාසකාරය)

දෙන්නැයි යන වචනය කටුක ය, නැතැයි, යන්න ද එසේ ම ය. දෙන්නය, නැතය යන වචන දෙක උපනුපන් ජාතියෙහි අසන්නට නොලැබේවා!